**සීමාසහිත කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම - 2016**

**-----------------------------------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හා පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") හා සමාගම් සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය")වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-------------------**

## 2.1 මතය

**--------**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත්

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.3.1 ඉන්වෙන්ට්‍රි පාලනය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ ක්‍රමවත් ඉන්වෙන්ට්‍රි පරීක්ෂා කිරීමේ ක්‍රමයක් නොමැත.

(ආ) අත ඇති තොග පිළිබඳ යාවත්කාලීන තොරතුරු කළමනාකරණය වෙත නොවූ අතර කිසියම් වෙනස්කමක් පැවතියේ නම් වර්ෂය අවසානය තෙක් එය දැනුවත් නොවනු ඇත.

(ඇ) සෙමින් චලනය වන ඉදිකිරීම් අමු ද්‍රව්‍ය තොග සඳහා විස්තරාත්මක හානිකරණ පරීක්ෂාවක් සමාගම විසින් සිදුකර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.85,879,218 ක් හා රු.214,113,763 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ සමාගමේ හා සමූහයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.766,910 ක් හා රු.173,803,716 ක් වූයෙන් සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.85,112,308 ක් හා රු.40,310,047 ක වර්ධනයක් දැක්වුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.2.1 මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශය**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | සමූහය | | සමාගම | |
| | 2016 | 2015 | 2016 | 2015 |
| | රු. | රු. | රු. | රු. |
| වෙනත් ආදායම | 150,837,363 | 1,755,453 | 80,000,000 | - |
| පරිපාලන වියදම් | (141,351,666) | (97,339,174) | (8,242,318) | (9,494,182) |
| දේපල, පිරියත හා උපකරණ හානිකරණය | - | (111,373,340) | - | - |
| මූල්‍ය ආදායම | 204,628,067 | 299,152,468 | 14,121,535 | 10,261,092 |
| FVTPL ලෙස විශ්ලේෂණය කරන ලද මූල්‍ය වත්කම්වල සාධාරණ අගය වෙනස්වීම | - | 81,608,309 | - | - |
| බදුවලට පෙර ලාභය | 214,113,764 | 173,803,716 | 85,879,217 | 766,910 |
| ආදායම් බදු වියදම | (53,877,612) | (50,393,907) | (22,481,218) | (1,847,562) |
| වර්ෂය සඳහා ලාභය/ (පාඩුව) | 160,236,152 | 123,409,809 | 63,397,999 | (1,080,652) |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

4.1.1 සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම හා සීමාසහිත හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමට පිළිවෙලින් අයිති ලියාපදිංචි අංක WP PW 2565 දරන මෝටර් රථය හා WP KY 2208 දරන ලෑන්ඩ් රෝවර් ජීප් රථය මුදල් අමාත්‍යාංශයේ සන්තකයෙහි පැවතුණි. මෙම වාහන වලට අදාළ බදු ගිවිසුම් සමාගම් විසින් ආරම්භ කර තිබුණි. කෙසේ වුවද, මෙම ගිවිසුම් පිළිබඳ මුදල් අමාත්‍යාංශය විසින් දැනගත යුතු විය. එසේම එම ගිවිසුම්වල හඳුනාගත් ආරම්භක කාල පරිච්ඡේදයද ඉකුත් වී තිබුණු බව අවධානයට ලක් කෙරේ.

4.1.2 සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ලෙහිම කැන්විල් ගෲප් (කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම හා සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම) පිහිටා තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂය සඳහා ලිට්රෝ ගෑස් ලංකා සමාගම සමඟ විධිමත් කුලී ගිවිසුමකට එළඹ නොතිබුණද පහත සඳහන් වියදම් ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් කැන්විල් හෝල්ඩින්ග්ස් සමාගමෙන් අයකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදමේ ස්වභාවය** | **මුදල** |
|---|---|
| | රු. |
| කුලී | 2,960,302 |
| විදුලිය | 1,533,064 |
| ආරක්ෂිත වියදම් | 592,034 |
| වරිපනම් | 249,462 |
| ජලය | 44,461 |
| එකතුව | 5,379,323 |

## 4.2 බලය නොලත් ගනුදෙනු

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය නොමැතිව 2016 වර්ෂයේදී රු.11,240,711 ක් වටිනා අතිරේක වැඩ සීමාසහිත සීනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම විසින් සිදු කර තිබූ අතර එය කොන්ත්‍රාත්කරුවන් සමඟ වූ ආරම්භක කොන්ත්‍රාත් ගිවිසුම්වල තිබූ කොන්දේසිවලින් බැහැර වීමක් විය.